# (ඉ) ග්‍රාමීය බැංකු කටයුතු සහ ණය

ග්‍රාමීය අංශය සඳහා කෘෂිකාර්මික ණය ප්‍රධාන වශයෙන් සපයනු ලබන්නේ නව කෘෂිකාර්මික ණය ක්‍රමය සහ සමුපකාර ග්‍රාමීය බැංකු මගිනි. මෙයට අමතරව නියමිත කාර්යයන් සඳහා රජයේ දෙපාර්තමේන්තු විසින් මෙහෙයවනු ලබන ණය ක්‍රම මගින්ද, වාණිජ බැංකු[1] සහ විශේෂිත ණය ආයතන මගින් ද ග්‍රාමීය අංශයට ආයතනික ණය සපයනු ලැබේ.

## (1) සමුපකාර ග්‍රාමීය බැංකු

ග්‍රාමීය බැංකුවල තැන්පතු සහ ණය පිළිබඳ තත්ත්වය ත්‍රෛමාසිකව II (ඉ) 1 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වයි. 1971 දී ග්‍රාමීය බැංකු විසි එකක් පිහිටුවා ඇති අතර එයින් විස්සක් ම පිහිටුවා ඇත්තේ වර්ෂයේ අවසාන කාර්තුව තුළදීය. 1971 වර්ෂයේදී ග්‍රාමීය බැංකු වල ඉතුරුම් තැන්පතු ගිණුම් සංඛ්‍යාව මීට පෙර වර්ෂයට වඩා 10,432 කින් වැඩිවී ඇත. වර්ෂයේ අවසාන කාර්තුවේදී ගිණුම් සංඛ්‍යාවෙහි වැඩිවීම කැපී පෙනුනේ එම කාර්තුවෙහි පිහිටුවනු ලැබූ නව ග්‍රාමීය බැංකු විස්සෙහි විවෘත කරන ලද 3,677 ක් වූ නව ගිණුම් සංඛ්‍යාවත් සමගය.

විමුද්‍රාපනයෙන් පසුව 1970 අවසන් කාර්තුව තුළදී ඉතුරුම් තැන්පතු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 16·1 දක්වා සීඝ්‍රයෙන් නැගුණු අතර එය 1971 මුල් කාර්තුවේදී රුපියල් දශලක්ෂ 14·8 දක්වා අඩු විය. ඉන් අනතුරුව වර්ෂය තුළදී ක්‍රමික නැග්මක් පෙන්වූ ඉතුරුම් තැන්පතු මට්ටම 1971 අවසානයේ රුපියල් දශලක්ෂ 17·2 දක්වා වැඩි විය. මෙය 1970 අවසානයේ වූ මට්ටමට වඩා රුපියල් දශලක්ෂ 1 ක හෝ සියයට 6.7 ක වැඩිවීමක් පෙන්විය. 1970 අවසානයෙහි වූ ඉතුරුම් තැන්පතු ප්‍රමාණයට විමුද්‍රාපනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ගෘහස්ථයන් සාමාන්‍යයෙන් ගනුදෙනු සඳහා රාශීකරණය කොට ගෙන තිබූ මුදල් ශේෂයන්ගෙන් එක්තරා ප්‍රමාණයක කොටසක් ද ඇතුළත් වී ඇති බව සැලකිය යුතුය. 1971 පළමු කාර්තුව අවසානයේ මෙම තැන්පතු වලින් යම් ප්‍රමාණයක් මෙම ගනුදෙනු වලින් කොටසක් පිරිමසා ගැනීම සඳහා ආපසු ගත්තා වියහැක. එමනිසා, 1971 පළමු කාර්තුව සඳහාවූ දත්ත 1971 අවසානයේදී වූ අනුරූප සංඛ්‍යාව සමඟ සසඳා බැලීමට වඩා උචිත වනු ඇත. 1971 අවසන් නව මාසය තුළ ඉතුරුම් තැන්පතු වල රුපියල් දශලක්ෂ 2·4 ක හෝ සියයට 16·2 ක ශුද්ධ වැඩිවීමක් මෙම සැසඳීම පෙන්නුම් කරයි. 1971 අවසන් කාර්තුව තුළ ඉතුරුම් තැන්පතු ගිණුම් සංඛ්‍යාවෙහි වැඩිවීමක් වූව ද මෙම කාලසීමාවෙහිම ඉතුරුම් තැන්පතු ප්‍රමාණය පෙන්වූයේ මැදහත් වැඩිවීමක් පමණකි. 1971 අවසන් කාර්තුවේදී නව ඉතුරුම් තැන්පතු රුපියල් 142,237 ක්වූ අතර 1971 අවසන් නව මාසය තුළදී සියයට 5·9 ක ශුද්ධ වැඩිවීමක් පමණක් නියෝජනය විය. 1970 අවසන් කාර්තුවේදී රුපියල් 322 දක්වා කැපී පෙනෙන ලෙස වැඩිවූ ඉතුරුම් තැන්පතු වල සාමාන්‍යයේ ප්‍රමාණය 1971 පළමු කාර්තුව තුළදී රුපියල් 283 තෙක් පහත වැටුණු අතර වර්ෂයේ ඉතිරි කාලසීමාවේදී, එය බොහෝ දුරට නොවෙනස්ව පැවතුණි. කෙසේ වූවද, II (ඉ) 1 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි මුළු වර්ෂයම ගත්කල 1971 ඉතුරුම් තැන්පතු වල සාමාන්‍යයේ ප්‍රමාණය මීට පෙර වර්ෂ වලට වඩා බොහෝ දුරට වැඩිය.

තුලනාත්මකව බලන කල ස්ථාවර තැන්පතු ගිණුම් සංඛ්‍යාවෙන් සුළුය. මෙම තැන්පතු වල සාමාන්‍ය ප්‍රමාණය ඉතුරුම් තැන්පතු වල සාමාන්‍ය ප්‍රමාණයට වඩා බොහෝ සේ වැඩිය. වර්ෂය තිස්සේ ස්ථාවර තැන්පතු ප්‍රමාණයේ නියත බැස්මක් පෙන්නුම් කළ අතර 1971 අවසානයේ මුළු ස්ථාවර තැන්පතු ප්‍රමාණය රුපියල් 676,106 ක් හෝ 1970 අවසානයේ තිබූ මට්ටමට වඩා සියයට 15·4 කින් හෝ අඩුවීමකි. 1971 දී ස්ථාවර තැන්පතු ප්‍රමාණයේ මෙම පහත බැස්ම මීට පෙර වර්ෂයන්හි නිරීක්ෂණය වූ වැඩිවෙමින් පැවතුණු උපනතියක ආපසු හැරීමකි. මෙම ගිණුම්හි තැන්පතු මාස 3, 6 සහ 9 වශයෙන් විවිධ කාලසීමාවන් සඳහා ස්ථාවරවූ ඒවාය. මෙම තැන්පතු සඳහා ගෙවන ලද පොළී අනුපාතයන් තීරණය කරනු ලැබූයේ ඒ ඒ සමුපකාර සමිති මගිනි. 1971 සාමාන්‍ය අනුපාතය වර්ෂයට සියයට 5 ක් පමණ විය.

1 1971 වර්ෂය ආරම්භයේ සිට මහජන බැංකුව විසින් ව්‍යාප්ත ණය ක්‍රමය යටතේ දෙනු ලබන ණය නවත්වන ලදී.

## II (ඉ) 1 වැනි සංඛ්‍යා සටහන

### ග්‍රාමීය බැංකුවල තැන්පතු හා ණය 1965 - 1971

ප්‍රමාණය රුපියල් වලින්

| කාර්තුව අවසානය | | බැංකු ගණන | තැන්පතු ගිණුම් | | | | | | | | | ණය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ඉතුරුම් | | | ස්ථාවර | | | එකතුව | | | | | |
| | | | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය |
| 1965 | මාර්තු .. | 6 | 1556 | 194,013 | 125 | 10 | 8,100 | 810 | 1566 | 202,113 | 129 | 572 | 489,485 | 856 |
| | ජූනි .. | 7 | 1925 | 305,250 | 159 | 7 | 3,682 | 526 | 1932 | 308,932 | 160 | 771 | 693,621 | 900 |
| | සැප්තැම්බර් .. | 8 | 2597 | 504,160 | 194 | 7 | 3,734 | 533 | 2604 | 507,894 | 195 | 1038 | 855,946 | 825 |
| | දෙසැම්බර් .. | 8 | 2924 | 491,626 | 168 | 9 | 4,734 | 526 | 2933 | 496,360 | 169 | 1153 | 914,699 | 793 |
| 1966 | මාර්තු .. | 8 | 3244 | 499,462 | 154 | 9 | 8,732 | 970 | 3253 | 508,195 | 156 | 1316 | 1,010,628 | 768 |
| | ජූනි .. | 8 | 3519 | 525,370 | 149 | 13 | 20,586 | 1583 | 3532 | 545,956 | 155 | 1433 | 1,072,293 | 748 |
| | සැප්තැම්බර් .. | 11 | 3923 | 604,505 | 154 | 11 | 19,868 | 1806 | 3924 | 624,373 | 159 | 1611 | 1,204,125 | 747 |
| | දෙසැම්බර් .. | 13 | 4636 | 703,011 | 152 | 15 | 22,737 | 1516 | 4651 | 725,748 | 156 | 1783 | 1,326,457 | 744 |
| 1967 | මාර්තු .. | 14 | 5150 | 707,475 | 137 | 16 | 21,587 | 1349 | 5166 | 729,062 | 141 | 2037 | 1,413,639 | 694 |
| | ජූනි .. | 16 | 5971 | 821,448 | 138 | 20 | 38,952 | 1948 | 5991 | 860,400 | 144 | 2173 | 1,560,560 | 718 |
| | සැප්තැම්බර් .. | 20 | 6968 | 1,038,201 | 149 | 28 | 40,242 | 1437 | 6996 | 1,078,433 | 154 | 2529 | 1,815,637 | 718 |
| | දෙසැම්බර් .. | 27 | 8792 | 1,305,846 | 118 | 41 | 65,381 | 1595 | 8833 | 1,371,227 | 155 | 2897 | 2,029,476 | 701 |
| 1968 | මාර්තු .. | 30 | 10378 | 1,650,228 | 159 | 85 | 111,430 | 1310 | 10463 | 1,761,658 | 168 | 3336 | 2,366,359 | 709 |
| | ජූනි .. | 34 | 12137 | 2,063,947 | 170 | 137 | 161,486 | 1179 | 12274 | 2,225,433 | 181 | 4128 | 2,592,847 | 628 |
| | සැප්තැම්බර් .. | 39 | 14689 | 2,643,592 | 180 | 254 | 221,270 | 871 | 14943 | 2,864,862 | 192 | 4713 | 3,105,393 | 659 |
| | දෙසැම්බර් .. | 44 | 17359 | 3,110,576 | 179 | 287 | 222,614 | 776 | 17646 | 3,333,190 | 189 | 5586 | 3,630,731 | 650 |
| 1969 | මාර්තු .. | 54 | 19763 | 3,624,967 | 183 | 621 | 267,109 | 430 | 20384 | 3,892,072 | 191 | 6109 | 4,161,873 | 681 |
| | ජූනි .. | 57 | 22314 | 4,406,770 | 197 | 575 | 383,550 | 667 | 22889 | 4,790,320 | 209 | 6770 | 4,397,882 | 669 |
| | සැප්තැම්බර් .. | 64 | 25598 | 4,930,514 | 193 | 687 | 437,884 | 637 | 26285 | 5,368,398 | 204 | 7379 | 4,969,245 | 673 |
| | දෙසැම්බර් .. | 68 | 28626 | 5,712,893 | 199 | 724 | 460,168 | 636 | 29350 | 6,173,061 | 210 | 7893 | 5,572,281 | 706 |
| 1970 | මාර්තු .. | 80 | 31663 | 6,209,882 | 196 | 420 | 521,345 | 1241 | 32083 | 6,731,227 | 209 | 8506 | 6,049,587 | 711 |
| | ජූනි .. | 86 | 34887 | 7,104,222 | 176 | 841 | 697,101 | 829 | 35728 | 7,801,323 | 212 | 8894 | 6,265,170 | 705 |
| | සැප්තැම්බර් .. | 89 | 38417 | 8,255,943 | 215 | 932 | 721,352 | 774 | 39349 | 8,977,295 | 220 | 9671 | 6,779,046 | 701 |
| | දෙසැම්බර් .. | 90 | 49939 | 16,109,287 | 322 | 892 | 799,117 | 896 | 50831 | 16,908,405 | 333 | 10017 | 7,122,213 | 711 |
| 1971 | මාර්තු .. | 90 | 52273 | 14,780,578 | 283 | 911 | 826,532 | 907 | 53184 | 15,607,110 | 293 | 10627 | 7,505,111 | 706 |
| | ජූනි .. | 90 | 53765 | 15,509,220 | 288 | 835 | 806,178 | 965 | 54600 | 16,315,398 | 299 | 10405 | 7,232,584 | 695 |
| | සැප්තැම්බර් .. | 91 | 56694 | 16,380,194 | 289 | 809 | 723,171 | 894 | 57503 | 17,103,365 | 297 | 10929 | 7,410,959 | 678 |
| | දෙසැම්බර් .. | 111 | 60371 | 17,188,297 | 285 | 838 | 676,106 | 807 | 61209 | 17,864,403 | 292 | 10725 | 7,144,913 | 666 |

මූලය:— ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව,
මහජන බැංකුව.

1971 දී ණයට දෙන ලද ප්‍රමාණය බොහෝ දුරට 1970 අවසන් කාර්තුව අවසානයේ තිබූ මට්ටමේම පැවතුණි. කෙසේ වුවද, ණය ගනුදෙනු සංඛ්‍යාව තරමක් දුරට වැඩි විය. වර්ෂයේ පළමු කාර්තු තුන තුළදී ණය ප්‍රමාණයේ සාමාන්‍යය අඩු විය. 1971 අවසන් කාර්තුවේදී ණය ගනුදෙනු සංඛ්‍යාව සහ එහි ණය ප්‍රමාණය පහත වැටුණේ ණය ප්‍රමාණයේ සාමාන්‍යය සහ ගනුදෙනු සංඛ්‍යාව යන දෙකෙහිම අඩුවීම නිසාය. 1969 ට වඩා 1970 වැඩිවූ රුපියල් දශලක්ෂ 1·5 වෙනුවට 1970 පැවති මට්ටමට වඩා 1971 ණය ප්‍රමාණය පෙන්වූයේ අවම වැඩිවීමකි. 1971 මුල් කාලයේ පටන්ගත් සමුපකාර ප්‍රතිසංවිධාන කාලය තුළ ණය දීමේ සීමාවන් පැනවීම මෙම පහත වැටීමට මූලික වශයෙන් හේතු විය.

II (ඉ) 2 සංඛ්‍යා සටහනෙහි පෙන්වා ඇති පරිදි 1970 මට්ටමට වඩා 1971 මුළු ණයදීම් ප්‍රමාණය කිසිදු සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් නොකළ අතර 1971 දී නිෂ්පාදන ණය රුපියල් දශලක්ෂ 1·68 සිට 1·52 දක්වා අඩුවී ඇත. මෙම අඩුවීම විශාල වශයෙන්ම, 1970 රුපියල් දශලක්ෂ 0·228 සිට 1971 දී රුපියල් දශලක්ෂ 0·115 දක්වා වූ ගෘහ කර්මාන්ත සඳහා දෙනු ලැබූ ණය වල පහත වැටීම පිළිබිඹු කිරීමෙකි. කෘෂිකර්ම නිෂ්පාදන සහ සත්ව පාලනය සඳහාවූ ණය 1970 දී තිබූ මට්ටමේම තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සෑම නිෂ්පාදන කටයුතු සඳහාම ණයදීම, මුළු ණයදීම් වල අනුපාතයක් වශයෙන් 1970 වේ වූ සියයට 23·5·1971 දී සියයට 21·2 දක්වා අඩු විය. 1971 දී නිවාස තැනීම සඳහා දෙනු ලැබූ ණය වලද, 1970 රුපියල් දශලක්ෂ 2.73 සිට 1971 රුපියල් දශලක්ෂ 2·58 දක්වා පහත වැටීමක් පෙන්නුම් කළේය. එය මෙම කාලසීමාවේම ප්‍රමාණානුකූලව සියයට 38·3 සිට සියයට 36·2 දක්වා පහත වැටුණි. ණය බේරීම සඳහා දෙන ලද ණය වලද මීට සමාන අඩුවීමක් විය. මෙම කාලසීමාව තුළ වෙළඳ කටයුතු, පරිභෝජන සහ "අනෙකුත්" ණය සඳහා දෙන ලද ණය රුපියල් දශලක්ෂ 0·70 සිට රුපියල් දශලක්ෂ 1·19 (හෝ සියයට 70·4) ක සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. මේවායෙහි වැදගත්කම දෙන ලද මුළු ණයෙන් සියයට 9·9 සිට සියයට 16·6 දක්වා වැඩිවීමෙන් දක්වේ. පැහැදිලි වශයෙන්ම සමුපකාර ප්‍රතිසංවිධානය සහ එක්තරා ප්‍රමාණයකට ඉහළ ණය සීමා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදනය, නිවාස තැනීම, ණය බේරීම සහ විද්‍යුත්කරණය සඳහා දෙනු ලැබූ ණයවල පහත වැටීමක් වූ අතර, මුළු ණයෙහි සමස්ථ ආන්තික වැඩිවීමක් පෙන්නුම් කරමින් වෙළඳාම, පරිභෝජනය සහ විවිධ කටයුතු සඳහා දෙනු ලැබූ ණය වල වැඩිවීමක් විය[1].

## II (ඉ) 2 වැනි සංඛ්‍යා සටහන
### කාර්යයන් අනුව ග්‍රාමීය බැංකු ණය
### (සෑම වර්ෂයකම දෙසැ. 31 අවසානයට)

| කාර්යය | ප්‍රමාණය රුපියල් වලින් | | මුළු මුදලින් සියයට ගණන | |
|---|---|---|---|---|
| | 1970 | 1971 | 1970 | 1971 |
| නිෂ්පාදනය .. | 1,676,784 | 1,515,326 | 23·5 | 21·2 |
| කෘෂිකර්මාන්ත .. | 1,389,272 | 1,340,908 | 19·5 | 18·8 |
| සත්ව පාලනය .. | 59,790 | 58,978 | 0·8 | 0·8 |
| ගෘහ කර්මාන්ත .. | 227,722 | 115,440 | 3·2 | 1·6 |
| නිවාස .. | 2,731,812 | 2,583,646 | 38·3 | 36·2 |
| ණය නිදහස්වීම .. | 2,003,923 | 1,851,465 | 28·1 | 25·9 |
| වෙළඳාම .. | 381,580 | 401,062 | 5·4 | 5·6 |
| පරිභෝජනය .. | 90,945 | 97,172 | 1·3 | 1·4 |
| විදුලි බලය සැපයීම .. | 12,690 | 6,495 | 0·2 | 0·1 |
| අනෙකුත් .. | 224,476 | 689,745 | 3·2 | 9·6 |
| එකතුව . | 7,122,210 | 7,144,911 | 100·0 | 100·0 |

මූලය: ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව, මහජන බැංකුව.

1 "අනෙකුත්" වශයෙන් වර්ග කොට ඇති ණයට එක් සමුපකාර සමිතියක් 1971 දී ග්‍රාමීය බැංකුවක් හා ඒකාබද්ධ වීමට පෙර දී තිබූ ණයද ඇතුළත් වේ. මෙම සමිතියෙන් දී ඇති ණය ඉවත් කළහොත් 1971 ග්‍රාමීය බැංකු විසින් දී ඇති මුළු ණය 1970 අනුරූප ගණනට වඩා සියයට 5·67 කින් අඩුවිය හැක.

ග්‍රාමීය බැංකු වල මුළු තැන්පතු ප්‍රමාණය 1970 දෙසැම්බර් අවසානයේදී රුපියල් දශලක්ෂ 16·9 සිට 1971 දෙසැම්බර් අවසානය වන විට රුපියල් දශලක්ෂ 17·9 දක්වා ඉහළ නැගුණි. පළමුවන කාර්තුවේ මෙම තැන්පතු පහත වැටෙද්දී ඒවා 1971 මාර්තු මස රුපියල් දශලක්ෂ 15·6 සිට දෙසැම්බර් වන විට රුපියල් දශලක්ෂ 17·9 දක්වා වැඩි වූහ. වර්ෂය අවසානයේ දී මුළු තැන්පතු මුළු ණය ප්‍රමාණයට වඩා රුපියල් දශලක්ෂ 10·8 කින් වැඩි විය. මීට පෙර වර්ෂයේ වාර්ෂික වාර්තාවේ සඳහන් කළ පරිදි 1970 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා මුළු තැන්පතු ප්‍රමාණයේ සීඝ්‍ර වැඩිවීම වැඩිවශයෙන් ම විමුල්‍යානය නිසා සිදු වූවකි. නමුත් මාස තුනකට පසුව එනම් 1971 මාර්තු මසදී තැන්පතු ප්‍රමාණය රුපියල් දශලක්ෂ 15·6 දක්වා පහත වැටුණි.

මහජන බැංකුවේ නියෝජිතයන් ලෙස ග්‍රාමීය බැංකු උකස් කටයුතු වලද නිරත වෙත්. දෙවන පරිශිෂ්ටයෙහි 62 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි 1970 දී 18,092 ක්වූ උකස් කටයුතු සම්බන්ධ ගනුදෙනු සංඛ්‍යාව විමර්ශනයට භාජනය වන වර්ෂය තුළදී 21,044 දක්වා වැඩිවූ අතර ඒ සඳහා යෙදවූ මුදල් ප්‍රමාණය රුපියල් 1,980,070 සිට රුපියල් 2,171,734 දක්වා හෝ සියයට 9·7 කින් හෝ වැඩිවී ඇත.

**දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණය**

62 වැනි සංඛ්‍යා සටහනෙහි ග්‍රාමීය බැංකුවල තැන්පතු සහ ණය දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණය කොට ඇත.

දිස්ත්‍රික්ක අතුරින් වැඩිම ග්‍රාමීය බැංකු සංඛ්‍යාවක් වූයේ කොළඹ දිස්ත්‍රික්කයේ වූ අතර, පිළිවෙලින් කුරුණෑගල, රත්නපුරය, පොළොන්නරුව, බදුල්ල සහ කළුතර යන දිස්ත්‍රික්ක වැදගත් වූහ. මුළු තැන්පතු ප්‍රමාණයෙන් සියයට 25·5 කට ආසන්න ගණනක් කොළඹ දිස්ත්‍රික්කය තුළම විය. තැන්පතු වලින් සියයට 13·4 ක් නියෝජනය කරමින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුළු තැන්පතු ප්‍රමාණය රුපියල් දශලක්ෂ 2·4 ක්වූ අතර රත්නපුරය, මහනුවර, බදුල්ල, පොළොන්නරුව, කළුතර යන එක් එක් දිස්ත්‍රික්කයන්හි තැන්පතු රුපියල් දශලක්ෂයට වැඩි විය. සියළු ග්‍රාමීය බැංකුවල මුළු තැන්පතු වලින් සියයට 75·4 කට මෙම දිස්ත්‍රික්ක 7 කොටස් කාරි වූහ. රුපියල් 516 ක්වූ තැන්පතු ප්‍රමාණයේ උසස්ම සාමාන්‍යය වූයේ යාපනය දිස්ත්‍රික්කයේය.

**(2) නව කෘෂිකාර්මික ණය ක්‍රමය**

**(අ) වී වගා ණය**

නව කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ වී වගාව සඳහා දෙන ලද ණය ප්‍රමාණයන්, ආපසු ගෙවීම සහ පැහැර හැරීම II (ඉ) 3 වැනි සංඛ්‍යා සටහනෙහි පෙන්වා ඇත.

1970/71 මහ කන්නයේ වී වගාව සඳහා දෙන ලද ණය රුපියල් දශලක්ෂ 23·6 ක් හෝ එය 1969/70 උපයෝගී කොට ගත් මට්ටම (එනම් රුපියල් දශලක්ෂ 39·4) ට වඩා සියයට 40·1 කින් අඩුය. 1971 යල් කන්නයේ උපයෝගී කර ගත් ණය ප්‍රමාණය 1970 යල කන්නයේ වූ රුපියල් දශලක්ෂ 12·3 මට්ටමේ සිට රුපියල් දශලක්ෂ 5·5 දක්වා තියුණු ලෙස පහත වැටුණි. මෙම ක්‍රමය ආරම්භ කළ 1967/68 මහ කන්නයේ රුපියල් දශලක්ෂ 61·4 කට ළඟාවූ උපයෝගී කොට ගත් ණය මට්ටම පහත වැටීමේ උපනතියක් පෙන්නුම් කරන ලදී. ඉහත සඳහන් සංඛ්‍යා සටහනෙහි පෙන්වා ඇති පරිදි 1970/71 මහ සහ 1971 යල යන කන්න දෙකේදී උප යෝගී කොට ගත් ණය අවම මට්ටම් වලට ළඟා විය. මෙම පහත වැටීමේ උපනතිය සාමාන්‍යයෙන් මෙම ක්‍රමය යටතේ ගෙවීම් පැහැර හැරීම් ඉහළ අනුපාතයන් නිසා බැව් දක්විය හැකිය. ගෙවීම් පැහැර හැරියවුන් මෙම ක්‍රමය යටතේ තවදුරටත් ණය ගැනීමට නුසුදුස්සෝ වූහ.[1]

---

1 මෙම ක්‍රමය යටතේ ණය පැහැර හැරීමේ ඉහළ අනුපාතයන්ට හේතු සොයා බැලීම සඳහා 1972 මුල් කාලයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දිප ව්‍යාප්ත නියැදි සමීක්ෂණයක් පවත්වන ලදී. සමීක්ෂණයේදී රැස් කර ගත් දත්ත දැනට සකස් වෙමින් පවතී.

## II (ඉ) 3 වැනි සංඛ්‍යා සටහන

## නව කෘෂිකාර්මික ණය ක්‍රමය—වී වගාව සඳහා දෙනු ලැබූ ණය

| කන්නය / මෙහෙයවුම් කටයුතු | ප්‍රමාණය රුපියල් දශලක්ෂ වලින් | | | | | | | | | ප්‍රයෝජනයට ගත් ප්‍රමාණයේ සියයට ගණනක් වශයෙන් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මහ 67/68 | යල 1968 | මහ 68/69 | යල 1969 | මහ 69/70 | යල 1970 | මහ 70/71 | යල 1971 | මහ 71/72 | මහ 67/68 | යල 1968 | මහ 68/69 | යල 1969 | මහ 69/70 | යල 1970 | මහ 70/71 | යල 1971 | මහ 71/72 |
| දෙන ලද ණය .. .. | 61·4 | 11·3 | 45·8 | 9·9 | 39·4 | 12·3 | 23·6 | 5·5 | 6·5 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 |
| මුළු ආපසු ගෙවීම .. .. | 52·5 | 9·6 | 27·6 | 7·9 | 19·6 | 8·1 | 9·2 | 2·6 | 0·1 | 85·5 | 84·9 | 60·3 | 79·8 | 49·7 | 65·9 | 39·0 | 47·3 | 1·5 |
| (අ) සිය කැමැත්තෙන් .. .. | 43·1 | 9·1 | 25·4 | 7·7 | 19·6 | 7·5 | 9·2 | 2·6 | 0·1 | 70·2 | 80·5 | 55·5 | 77·8 | 49·7 | 61·0 | 39·0 | 47·3 | 1·5 |
| (ආ) සහල් සලාක කූපන් වලින් .. | 9·4 | 0·5 | 2·2 | 0·2 | 0·0 | 0·6 | 0·0 | 0·0 | 0·0 | 15·3 | 4·4 | 4·8 | 2·0 | 0·0 | 4·9 | 0·0 | 0·0 | 0·0 |
| වගා විනාශය නිසා ණය දීර්ඝ කිරීමෙන් .. | 0·2 | 0·0 | 4·4 | 0·5 | 0·6 | 0·0 | 0·0 | 0·0 | 0·0 | 0·3 | 0·0 | 9·6 | 5·0 | 1·5 | 0·0 | 0·0 | 0·0 | 0·0 |
| පැහැර නොහැරීමෙන් .. .. | 0·0 | 0·0 | 0·0 | 0·0 | 0·1 | 0·1 | 4·8 | 2·8 | 6·4 | 0·0 | 0·0 | 0·0 | 0·0 | 0·3 | 0·8 | 20·3 | 50·9 | 98·5 |
| පැහැර හැරීම .. .. | 8·7 | 1·7 | 13·8 | 1·5 | 19·1 | 4·1 | 9·6 | 0·1 | 0·0 | 14·2 | 15·1 | 30·1 | 15·2 | 48·5 | 33·3 | 40·7 | 1·8 | 0·0 |

මූලය: ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව,
මහජන බැංකුව·

පැහැර හැරීමේ අනුපාතය ක්‍රමිකව වැඩි විය. 1968/69 මහ කන්නයේ සියයට 60·3 සහ 1969/70 මහ කන්නයේ සියයට 49·7 හා සසඳන කල 1970/71 මහ කන්නයේ ආපසු ගෙවා ඇත්තේ ණය වලින් සියයට 39·0 ක් පමණකි. 1969 යල කන්නයේ සියයට 79·8 සහ 1970 යල කන්නයේ සියයට 65·9 සමග සසඳන කල 1971 යල් කන්නයේ උපයෝගී කොට ගත් ණය වලින් ආපසු ගෙවා ඇත්තේ සියයට 47·3 කි. 1970 ට පෙර ආපසු ලබා ගැනීම් වල වඩා උසස් මට්ටමක පැවැත්මට යම් ප්‍රමාණයකට බලපාන ලද්දේ ණය ලබා ගත් ගෘහස්ථයන්ගේ සහල් සලාක පොත් උකස් කිරීමේ ක්‍රමය මගින් ආපසු අයකර ගැනීමය. 1970 දී මෙම ක්‍රමය අවලංගු කිරීමට අනතුරුව ආපසු ලබා ගැනීම් සම්පූර්ණයෙන්ම සිය කැමැත්තෙන් ආපසු ගෙවීම් වලින් සමන්විත විය.

කෙසේ වුවද, ආපසු ගෙවීමට නියමිත එහෙත් තවම පැහැර නොහරින ලද ණය 1970/71 මහ සහ 1971 යල යන කන්න සඳහා දුන් ණය වලින් පිළිවෙලින් සියයට 20·3 සහ සියයට 50·9 කින් සමන්විත විය. මේ නිසා ආපසු ලබා ගැනීම් මට්ටමේ ප්‍රතිශතය වර්ෂය තුළදී තව දුරටත් දියුණුවීමක් පෙන්නුම් කළ හැක. නමුත් හිඟ නොවන ණය ඉවත් කළද, 1967/68 මහ කන්නයේ සියයට 14·2 සහ 1968/69 මහ කන්නයේ සියයට 30·1 හා සසඳන කල 1970/71 මහ කන්නයේ ගත් ණය වලින් පැහැර හැරීම් ප්‍රමාණයේ සියයට ගණන 40·7 ක් වේ. කෙසේ වුවද, එය 1969/70 මහ කන්නයේ පැහැර හැරීම් මට්ටමේ සියයට ගණනවූ 48·5 ටවඩා අඩුය.

**දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණය**

පිළිවෙලින් පසුගිය මහ සහ යල කන්න වල පැවති තත්ත්වය සමග සසඳන කල 1970/71 මහ කන්නයේ හම්බන්තොට සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කද, 1971 යල කන්නයේදී බදුල්ල සහ මඩකලපුව යන දිස්ත්‍රික්කද හැර අනෙක් සෑම දිස්ත්‍රික්කයකම උපයෝගී කර ගත් ණය සහ ආපසු ගෙවීම් මට්ටම් පහත වැටුණි. මෙය දෙවන පරිශිෂ්ඨයෙහි 63 වැනි සංඛ්‍යා සටහනෙහි පෙන්වා ඇත. දෙවන පරිශිෂ්ඨයේ 64 වැනි සංඛ්‍යා සටහනෙහි පෙන්වා ඇති පරිදි 1970 දක්වා ආපසු ගෙවීම්හි උසස් මට්ටම් පවත්වා ගෙන ගිය දිස්ත්‍රික්ක වලද ආපසු ගෙවීම්වල පිරිහීම පැහැදිලිවම කැපී පෙනින.

මහනුවර දිස්ත්‍රික්කයේ 1967/68 මහ කන්නයේදී ගත් ණය මුදල්වලින් සියයට 99 ක්වූ ආපසු ගෙවීම 1970/71 මහ කන්නයේදී සියයට 31 දක්වා පහත වැටුණි. මෙලෙසම 1970 දක්වා ආපසු ගෙවීම් පිළිබඳව නො කඩවාම හොඳ වාර්තා පවත්වාගෙන ආ අනෙක් සෑම දිස්ත්‍රික්කවලම ආපසු ගෙවීම් තවදුරටත් පිරිහිණ. එකම විශේෂය වූයේ 1970/71 මහ කන්නයේ ආපසු ගෙවීම් සියයට 80 ට වඩා වැඩි වූ බදුල්ල දිස්ත්‍රික්කයය.

1971 යල කන්නයේදී ගත් ණයවලින් ආපසු ගෙවීම්හි පැහැදිලි දියුණුවක් දකින ලද්දේ කෑගල්ල සහ මඩකලපුව දිස්ත්‍රික්කවල වූ අතර රත්නපුරය සහ මාතර දිස්ත්‍රික්කවල ආපසු ගෙවීම් මෙයට වඩා අඩු තත්ත්වයකින් විය[1].

**(ආ) අතිරේක බෝග වගා ණය**

1970/71 අතිරේක ආහාර බෝග වගාවන් සඳහා දෙනු ලැබූ ණය පිළිබඳ දත්තයන් දෙවන පරිශිෂ්ඨයෙහි 65 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

1969 ඔක්තෝබර් සිට 1970 සැප්තැම්බර් අතර කාලසීමාවේදී අතිරේක බෝග සඳහා දී ඇති ණය රුපියල් දශලක්ෂ 7·6 සිට 1970/71 මෙයට අනුරූප කාලසීමාවේදී රුපියල් දශලක්ෂ 5·1 දක්වා අඩු විය. සාමාන්‍යයෙන් පසුව දක්වන ලද කාලසීමාවේ ණය ආපසු ගෙවීම්හි සියයට ගණනද පහත වැටුණි. අර්තාපල් වගාව සඳහා ගෙන ඇති ණය වලින් ආපසු ගෙවීම 1969/70 සියයට 94·2 සිට 1970/71 දී සියයට 74·6 දක්වාද, මෙයට අනුරූප කාලසීමාවේදී එළවළු සඳහා

1 1970/71 මහ සහ 1971 යල කන්න සඳහා ණයට ගත් මුදල් වලින් ආපසු ගෙවීම් තවම කෙරිගෙන යන අතර වර්ෂය තුළදී ආපසු ගෙවීමේ මට්ටම් තවදුරටත් වැඩිවෙතැයි පෙන්විය හැක.

සියයට 84·7 සිට සියයට 55·3 දක්වාද, රතුළූනු සඳහා සියයට 72·7 සිට සියයට 53·8 දක්වා ද පහත වැටුණි. ණයෙන් ප්‍රධාන කොටසක් මිරිස්, රතුළූනු සහ අර්තාපල් සඳහා විය. යාපනය දිස්ත්‍රික්කය විසින් අතිරේක බෝග සඳහා දෙන ලද මුළු ණයෙන් වැදගත් කොටසකට හිමිකම් කීම පවත්වා ගන්නා ලදී.

### (3) නව කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ ණය පැහැර හැරීම් පිළිබඳ සමීක්ෂණය

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් නව කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ ලබා ගන්නා ලද ණය පැහැර හැරීමේ ඉහළ අනුපාතයට හේතු සොයා බැලීම සඳහා දිවයිනව්‍යාප්ත නියැදි සමීක්ෂණයක් පවත්වන ලදී. 1972 ජනවාරි සහ පෙබරවාරි කාලය තුළ ක්ෂේත්‍ර කටයුතු නිම කෙරුණ අතර සමීක්ෂණයෙන් රැස්කර ගන්නා ලද දත්ත දැනට සකස් වෙමින් පවතී.